



නියපොතු වැඩ





පට්ටල් වැඩ



ලාක්ෂා භාණ්ඩ අලංකාර කිරීම











ලාක්ෂාවලින් අලංකාර කරන ලද භාණ්ඩ

# • ලාක්ෂා කර්මාන්තය

1. · ලාක්ෂා කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ප්‍රදේශ සහ ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය නම් කරන්න.
11. - ලාක්ෂා කර්මාන්තය සඳහා යොදා ගන්නා තාක්ෂණ ක්‍රම, ශිල්ප ක්‍රම සහ උපකරණ පිළිබඳ ව විස්තර කරන්න.
111. - ලාක්ෂා භාවිත කොට අලංකරණය කරනු ලබන පාරිභාරික භාණ්ඩ වර්ග සහ යොදා ගනු ලබන මෝස්තර නම් කරන්න.

**ඓතිහාසික පසුබිම**

මහනුවර යුගයේ දී ලාක්ෂා කලා කර්මාන්තය වඩාත් ප්‍රචලිත ව පැවති බවට සාධක පවතී. " කොට්ටල් බද්ද" නමැති රාජකීය කාර්මික කාර්යාංශයේ පවා ඔවුන් සේවය කොට ඇත. එහි දී ඔවුන් හඳුන්වා ඇත්තේ "හංගිඩි වසම" යනුවෙනි. එම ශිල්පීන් "හංගිඩියන්" යනුවෙන් මෙම යුගයේ දී හඳුන්වා තිබේ.

**ප්‍රචලිත ප්‍රදේශ**

මාතලේ- හපුවිද<br>
කෑගල්ල - අඟුල් මඩුව<br>
මහනුවර - හුරිකඩුව<br>
බලංගොඩ - පල්ලේකන්ද

මේ අතරින් වර්තමානය වන විටත් මෙම කලා කර්මාන්තය වඩාත් සක්‍රිය ව පවතින්නේ මාතලේ හපුවිද ප්‍රදේශයේ ය.

**අමුද්‍රව්‍ය**

ලාක්ෂා කලා කර්මාන්තය සඳහා වන ප්‍රධාන අමුද්‍රව්‍යය ලාක්ෂා ය. මේවා ලාක්ෂා නමැති කෘමියාගෙන් ලබා ගනී.

**අමුද්‍රව්‍ය සකස් කරගන්නා ආකාරය**

ලාක්ෂා කෘමියාගේ ශරීරයෙන් පිට වන ලාටු වැනි ද්‍රව්‍යය සුළං වැදී සහ වී ලාක්ෂා බවට පත් වේ. එම ද්‍රව්‍යය අඩංගු අතු රිකිලි කපාගෙන පවනේ වේළා ඒවායේ ඇති ලාක්ෂා පිහියක් වැනි ආයුධයකින් සූරා ගත යුතු ය. ඉන් පසු කපු රෙදි කඩක ඔතා තදින් ගැට ගසා ලිපට ඉහළින් අල්ලා රත් කොට උණුවෙන පිරිසිදු ලාක්ෂා මිරිකා ඉවතට ගත යුතු ය. එසේ ලබා ගත් ලාක්ෂා නැවත රත් කොට කැබලිවලට වෙන් කොට ගනී.

**සායම් පිළියෙළ කර ගන්නා ආකාරය**

රතු - සාදිලිංගම්
කුඩුකළු - පහන් දූලි හෝ කැකුණ දූලි
කහ - හිරියල්
කොළ - කහ හිරියල් සහ නිල් පාට එකතු කොට සාදා ගත් ලාක්ෂා කෝටු දෙකක සවි කොට ගෙන රත් කර. සායම් කුඩු මිශ්‍ර කර හොඳින් පදම ලැබෙන තුරු අදිමින් සකස් කර ගත යුතු ය.

**ලාක්ෂා භාවිතය**

දැවමය භාණ්ඩවල මතුපිට අලංකාර කිරීම සඳහා පමණක් ලාක්ෂා භාවිත කෙරේ.

**ශිල්ප ක්‍රම**

ලාක්ෂා මඟින් සැරසිලි යොදන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකකි. (දැවමය භාණ්ඩවල පමණක් ලාක්ෂා මෝස්තර යෙදීම සිදු කරනු ලැබේ.)

**නියපොතු වැඩ -**

මෙහි දී ලාක්ෂා කෙඳි භාවිත කොට සැරසිලි යොදයි. රත් කළ ලාක්ෂා කැබැල්ල ඇඟිලිවලින් අල්ලා ඇදීමෙන් මෙම දික් කෙඳි සකස් කරගත හැකි ය. එක් පැහැයක කෙඳි භාණ්ඩය මත ඇලවීමෙන් පසු අනෙකුත් වර්ණවල කෙඳිවලින් මෝස්තර යොදනු ලැබේ. මේ සඳහා නියපොත්ත භාවිත කරන බැවින් මෙම ක්‍රමය "නියපොතු වැඩ" යනුවෙන් හැඳින්වේ.

**පට්ටල් වැඩ -**

පට්ටලයට අල්ලන ලද භාණ්ඩය කැරකැවෙන විට රත් කර ගත් ලාක්ෂා කැබැල්ල එයට අල්ලනු ලැබේ. එහි දී භාණ්ඩයේ ලාක්ෂා ඒකාකාර ව හොඳින් තැවරේ. විශාල භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රමය බහුල ව භාවිත වේ. එසේ එක් වර්ණයක් සම්පූර්ණ භාණ්ඩය මත තවරා පසු ව මෝස්තර යොදනු ලැබේ.

**ලාක්ෂාවලින් මෝස්තර යෙදීම සඳහා භාවිත වන සැරසිලි ඒකක**

| | | | |
|---|---|---|---|
| වැල්පොත | ලණු දඟය | ගල්බින්දු | බෝකොළ |
| පළාපෙති | තනි බින්දුව | කුන්දිරික්කන් | තනිපට ලණුව |
| දෙපට ලණුව | | | |

**ලාක්ෂා ආධාරයෙන් අලංකාර කරනු ලබන භාණ්ඩ**

බුලත් තට්ටු, සේසත් මිටි, කොඩි මිටි, හෙල්ල මිටි, බිරළු, බුලත් තට්ටු, සැරයටි, වටාපත් මිටි, උඩැක්කි කඳන්